සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved



**6 ශ්‍රේණිය** | **පළමු වාර පරීක්ෂණය - 2019** | **44 S**

නම ...............................................

**නැටුම් I කොටස**

**කාලය පැය දෙකයි**

**උපදෙස් :**
**සියලුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**

- **1 - 5 දක්වා වූ ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01.නර්තනයක් ආරම්භ කිරීමේ දී පළමුව සිදු කරනු ලබන්නේ,
1. නමස්නාර සරඹය කිරීම ය.  2. කස්තිරම නර්තනය සිදු කිරීම ය.
3. පා සරඹ නර්තනය කිරීම ය.  4. ගොඩ සරඹ නර්තනය කිරීම ය.

02.පා සරඹ නර්තනය කිරීමේ දී තාල තැබීම සඳහා යොදා ගනු ලබන තාලවාද්‍ය භාණ්ඩය වනුයේ,
1. ගැට බෙරය යි.  2. පන්තේරුව යි.  3. තාලම්පට ය.  4. තම්මැට්ටම ය.

03.නර්තනයට අවශ්‍ය පරිදි ශරීරය හැඩගස්වාගැනීමට කරනු ලබන මූලික අභ්‍යාසය වන්නේ
1. නමස්කාර සරඹ අභ්‍යාස  2. නම්‍යතා අභ්‍යාස
3. ගොඩ සරඹ අභ්‍යාස  4. අත් සරඹ අභ්‍යාස

04.සෑම ගොඩ සරඹයක් අවසානයේ දීම ඊට අදාළව නර්තනය කරනු ලබන්නේ,
1. සීරුමාරුව ය.  2. අඩව්ව ය.  3. මණ්ඩිපද ය.  4. කස්තිරම ය.

05.පරිසර සුන්දරත්වයෙන් ඇසෙන කුරුලු නාදය වැනි මිහිරි නාදයන් නිසා
1. දුක ඇති වේ.  2. සතුට ඇති වේ.
3. කණස්සල්ල ඇති වේ.  4. කරුණාව ඇති වේ.

- **පහත සඳහන් වාක්‍යය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

06. නමස්කාර සරඹයේ දෙවන වැඳීම බුදුන් සඳහා වේ. (        )

07. සුළු තනිතිත සැදීම සඳහා අවශ්‍ය මාත්‍රා 2 කි. (        )

08. තෙයිකිට තෙයිකිට තෙයිකිට තෙයි තාම් යනු තුන්වන පා සරඹයයි. (        )

09. මව්පිය සෙනෙහස හා දරුවන් සනසාලීමට නැලවිලි කවි ගායනාකරනු ලබයි. (        )

10. හිරු දෙවියන්ට පූජෝපහාර දැක්වීම සඳහා තෛයිපොංගල් උත්සවය
පවත්වනු ලැබේ. (        )

- **ප්‍රශ්න අංක 11-15 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී වරහන් තුළ දී ඇති පිළිතුරු වලින් තෝරා හිස්තැනට සුදුසු වචනය ලියන්න.**

(කළගෙඩි, මණ්ඩිය, පලමුවන, හනුමා, සරල බව)

11. නර්තනයේ මූලික අංගහාරය ........................................................................ වේ.

12. ජේළි සැදී අඟනෝ සැරසීලා මෙය ........................................................ කවියකි.

13. වඳුරෙකුගේ හැසිරීම් රටාව ......................................... වන්නමෙන් නිරූපණය කෙරේ.

14. "තත් ජිත් තොං නං තා' යනු ................................................... ගොඩ සරඹයේ කස්තිරම වේ.

15. ............................................................ නමස්කාර අභ්‍යාසයේ විශේෂ ලක්ෂණයකි.

- **A කොටසේ දැක්වෙන වචනයට ගැළපෙන වචනය B කොටසින් තෝරා යා කරන්න.**

| | A කොටස | B කොටස |
|---|---|---|
| 16. | අහසේ දෙවියෝ රැස්ව සිටින්නයි | දෑ අඩිය |
| 17. | ඔවාද සිප්ප දාන්නේ | ගැමි නැටුම් |
| 18. | ගැමියාගේ සිතුම් පැතුම් ඇදහිලි හා විශ්වාස බලපායි | ලීකෙළි |
| 19. | දෙවන ගොඩ සරඹය | දණ්ඩි කඳ |
| 20. | පා සරඹ | ගුරු නමස්කාරය |

# II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු සපයන්න.**

(01) i. මූලික චලන වර්ග 02 ක නම් කරන්න.
ii. නමස්කාර අභ්‍යාසයේ විශේෂ ලක්ෂණ 03 ක් ලියන්න.
iii. නමස්කාර සරඹයේ තුන්වන වැඳීමෙන් පුද ලබන්නේ කවුරුන්ද?
iv. මණ්ඩියට සිටීමේ දී දෙපා අතර සම්මත දුර කොපමණද?
v. අත් සරඹ හඳුන්වනු ලබන වෙනත් නාමයක් ලියන්න.

(02) i. ඔබ කැමති ගැමි නැටුම් 02 ක් නම් කර ඊට අදාළ රංග උපකරණ 2 ක් ලියන්න.
ii. කළගෙඩි හෝ ලීකෙළි කවියක් ලියන්න.

(03) i. නර්තනය හැදෑරීමේ දී ඔබ අනුගමනය කරනු ලබන චාරිත්‍ර විධි 02 ක් ලියන්න.
ii. ගුරු වන්දනා ගාථාවේ සිංහල තේරුම ලියන්න.

(04) i. පාරිසරික සුන්දරත්වය ඇති වීමට පරිසරය තුළ දක්නට ලැබෙන ස්වභාවික වස්තූන් 03 ක් ලියන්න.
ii. පරිසරයේ අසිරිය පිළිබඳ කවියක් නිර්මාණය කරන්න.

(05) i. තෛයිපොංගල් සැරසිලි සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය 03 ක් ලියන්න.
ii. තෛයිපොංගල් උත්සවයේ කෝලම් රටාවක් අඳින්න.

# පළමු වාර පරීක්ෂණය - 2019

06 ශ්‍රේණිය **නර්තනය**

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - 1 | 6 - ✗ | 11 - මණ්ඩිය | 16 - ලී කෙළි |
| 2 - 3 | 7 - ✓ | 12 - කළගෙඩි | 17 - ගුරු නමස්කාරය |
| 3 - 3 | 8 - ✓ | 13 - හනුමා | 18 - ගැමි නැටුම් |
| 4 - 4 | 9 - ✓ | 14 - පළමුවන | 19 - දැඩිය |
| 5 - 2 | 10 - ✓ | 15 - සරල බව | 20 - දණ්ඩි කඳ |

(ලකුණු 1x 20 = 20)

## II කොටස

(01) i. සංචාරී චලන
ස්ථිතික චලන
ii. සැහැල්ල බව, සරල බව, නම්‍යශීලී බව, සමබරතාව, කායික හා මානසිකප්‍රබෝදය, හැඩතල, අවකාශ භාවිතය, ඉරියව් හා වේගය
iii. ගුරුවරු සහ දෙමව්පියන් සඳහා
iv. මිටි ලියනය
v. ගොඩ සරඹ (ල. 2 x 5 = 10)

(02) i. ලී කෙළි - ලී, කළගෙඩි - කල , කුළු - කුල්ල ආදී වශයෙන් නම් කර උපකරණ ලියා ඇත්නම් (ල. 05)
ii. කවියක් ලියා ඇත්නම් (ල. 05)

(03) i. බුදුන් වැඳීම, ගුරුවරයාට නමස්කාර කිරීම, පාවහන් ගලවා පංති කාමරයට ඇතුළු වීම, බෙරයට වැඳීම. (ල. 05)

ii. ඔවා සිප් දීමෙන - මා හික්මවන ප්‍රේමෙන
ඇඳුරු හද බැතියෙන - වඳිමු ගරු සිත පෙරටු කරගෙන (ල. 05)

(04) i. ගංගා, ඇලදොල, ගස් වැල්, කඳු වැටි , දිය ඇලි, මුහුද (ල. 05)
ii. කවියක් නිර්මාණය කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

(05) i. කොහොඹ කොළ, ගොක් කොළ, අඹ කොළ, වර්ණවත්සහල්පිටි, කහ කුඩු, කෙසෙල් ගස්, කැකුළු හාල්, පොල් කුඩු (ල. 05)
ii. කෝලම් රටාවක් ඇඳ ඇත්නම් (ල. 05)